Lesson 60 **Sujatha**

සුජාතා

Finally, I found No. 26. The gate was open. I entered and rang the bell. A few seconds later,
the door opened. A pleasant young girl stood there and gave me a nice smile.
ෆයිනලි අයි ෆවුන්ඩ් නම්බ(ර්) ට්වෙන්ටි සික්ස් . ද ගේට් වෝස් ඕපන්. අයි එන්ට(ර්)ඩ් ඇන්ඩ් රෑං ද බෙල්. අ ෆිව් සෙකන්ඩ්ස් ලේට(ර්) ද ඩෝ ඕපන්ඩ් . අ ප්ලෙසන්ට් යං ග(ර්)ල් ස්ටුඩ් දෙයා(ර්) ඇන්ඩ් ගේව් මී අ නයිස් ස්මයිල්

අවසානයේ මම නොම්මර 26 සොයා ගතිමි . ගේට්ටුව තිබුනේ විවෘතවය. මම ඇතුළු වී සීනුව නාද කලෙමි . තත්පර කීපයකට පසුව දොර විවෘත විය. ප්‍රසන්න තරුණ ගැහැණු ළමයෙක් එහි සිටගෙන සිට මා සිනහවක් පෑවාය.

“Is Ms. Sujatha in?” I asked. Even before she answered, I knew she was Sujatha’s daughter.

ඉස් මිස් සුජාතා ඉන් ? අයි ආස්ක්ඩ් . ඊවන් බිෆෝ ෂී ආන්ස(ර්)ඩ් අයි නිව් ෂී වෝස් සුජාතා’ස් ඩෝට(ර්)

මිස් සුජාතා ඉන්නවද ? මම ඇසුවෙමි . ඇය උත්තර දෙන්නත් ප්‍රථම , ඇය සුජාතාගේ දියණිය බව මම දැන ගතිමි

I could tell from her appearance; she resembled Sujatha a lot. But the girl looked puzzled.

අයි කුඩ් ටෙල් ෆ්‍රොම් හ(ර්) ඇපියරන්ස් , ෂී රිසෙම්බල්ඩ් සුජාතා අ ලොට් . බට් ද ග(ර්)ල් ලුක්ඩ් පස්ල්ඩ්

ඇගේ පෙනුමෙන් මට කිව හැකි වුනි . ඇය බොහෝ සෙයින් සුජාතාට සමාන වුවාය .නමුත් යුවතියගෙන් දිස් වූවේ ගැටළු සහගත බවකි (appearence - ඇපියරන්ස් - පෙනුම resemble - රිසෙම්බල් - සමාන වෙනවා)

“Isn’t this Ms. Sujatha Perera’s house?” I asked again.
“ඉස්න්ට් දිස් මිස් සුජාතා පෙරේරා’ස් හවුස් ? “අයි ආස්ක්ඩ් අගේන්
මේ මිස් සුජාතා පෙරේරා ගේ ගෙදර නෙවෙයිද ? මම නැවත ඇසුවෙමි

“Sorry, there’s no one called Sujatha Perera here,” the girl said politely with a lovely smile.

“සොරි , දෙයා(ර්)’ස් නෝ වන් කෝල්ඩ් සුජාතා හියර(ර්)” ද ගර්(ර්)ල් සේඩ් පලයිට්ලි විත් අ ලව්ලි ස්මයිල්

“සමාවෙන්න , මෙහෙ සුජාතා පෙරේරා කියල කෙනෙක් නැහැ “ යුවතිය මනරම් සිනහවක් සමග ආචාරශීලිව කීවාය

“There’s a lady called Sujatha in this area , but she lives further down the lane.”

“දෙයා(ර්)’ස් අ ලේඩි කෝල්ඩ් සුජාතා ඉන් දිස් ඒරියා ,බට් ෂී ලිව්ස් ෆ(ර්)ද(ර්) ඩවුන් ද ලේන්

සුජාතා කියල ලේඩි කෙනෙක් මේ හරියේ ඉන්නවා නමුත් එයා ඉන්නේ මේ පාරේ තව එහා

I was disappointed. However, I thanked her and got back on the road to find the next

Sujatha.

අයි වෝස් ඩිසපොයින්ටඩ්. හව්එව(ර්),අයි තෑන්ක්ඩ් හ(ර්) ඇන්ඩ් ගොට් බැක් ඔන් ද රෝඩ් ටු ෆයින්ඩ් ද නෙක්ස්ට් සුජාතා

මම අපේක්ෂා භංගත්වයට පත් වීමි . කෙසේ වුවත් මම ඇයට ස්තුති කොට යලි මගට බැස්සේ ඊලග සුජාතාව සොයා ගැනීම සදහාය

I found the place with the help of the directions given by the girl, but that wasn’t the

Sujatha I was looking for.

අයි ෆවුන්ඩ් ද ප්ලේස් විත් ද හෙල්ප් ඔෆ් ද ඩිරෙක්ෂන්ස් ගිවන් බයි ද ගර්(ර්)ල් , බට් දැට් වොස්න්ට් ද සුජාතා අයි වෝස් ලුකිං ෆෝ

යුවතිය විසින් දුන් මග පෙන්නීම් වල අධාරයෙන් මම ස්ථානය සොයා ගතිමි , නමුත් ඒ මා සෙවූ සුජාතා නොවූනි. (direction - ඩිරෙක්ෂන් - දිශාව) (directions - මඟ පෙන්වීම්)

That was a grumpy, fat woman. She almost suspected me of being a thief

දැට් වෝස් අ ග්‍රම්පි , ෆැට් වුමන් . ෂී ඕල්මෝස්ට් සස්පෙක්ටඩ් මී ඔෆ් බීන් අ තීෆ්

ඒ නුරුස්සන සුළු මහත ගැහැනියකි . තව පොඩ්ඩෙන් ඇය මා සොරෙකැයි සැක සිතුවාය .

Very disappointed, I was walking back. I got a feeling that I would probably never see her again.

වෙරි ඩිසපොයින්ටඩ් , අයි වෝස් වෝකිං බැක් . අයි ගොට් අ ෆීලින් දැට් අයි වුඩ් ප්‍රොබබ්ලි නෙවර්) සී හ(ර්) අගේන්

බෙහෙවින් අපේක්ෂා භංගත්වයට පත්ව , මම යලි ඇවිද එමින් සිටියෙමි . මා යලි කිසි දිනෙක ඇයව නොදකිවි යැයි යන හැගීමක් මට ඇති වුනි

But my mind said that girl must be Sujatha's daughter. She looked very much like her

බට් මයි මයින්ඩ් සේඩ් දැට් ග(ර්)ල් මස්ට් බී සුජතා'ස් ඩෝට(ර්) බිකෝස් ෂී ලුක්ඩ් වෙරි මච් ලයික් හ(ර්)

නමුත් මගේ සිත කීවේ ඒ යුවතිය සුජාතාගේ දියණියම බවයි. ඇය බෙහෙවින් ඇය මෙන් පෙනුණි

As I was passing that house, I looked at it again.

ඈස් අයි වෝස් පාසිං දැට් හවුස් , අයි ලුක්ඩ් ඇට් ඉට් අගේන්

මම ඒ නිවස පසු කරන අතර යලි ඒ දෙස බැලුවෙමි

"Uncle!" The girl smiled at me through a window. Then she hurried over to the door and opened it.

අංකල් ! ද ග(ර්)ල් ස්මයිල්ඩ් ඇට් මී ත්‍රෲ අ වින්ඩෝ . දෙන් ෂී හරිඩ් ඕව(ර්) ටු ද ඩෝ ඇන්ඩ් ඕපන්ඩ් ඉට්

අංකල් ! යුවතිය ජනේලයක් තුලින් මා සමග සිනාසුනාය. අනතුරුව ඇය කඩිනමින් දොර ලගට පැමිණ එය විවර කලාය

"Did you find her?" She asked

ඩිඩ් යූ ෆයින්ඩ් හ(ර් ? ෂී ආස්ක්ඩ්

ඔයා එයාව හොයා ගත්තද ? ඇය ඇසුවාය

"No, that's not the one I am looking for."

නෝ ,දැට්ස් නොට් ද වන් අයි වෝස් ලුකිං ෆෝ

නෑ , ඒ මං හොයන කෙනා නෙවෙයි

“It just came to my mind that my mom’s second name is Sujatha, and she was Perera before marriage.”

ඉට් ජස්ට් කේම් ටු මයි මයින්ඩ් දැට් මයි මම්’ස් සෙකන්ඩ් නේම් ඉස් සුජාතා , ඇන්ඩ් ෂී වෝස් පෙරේරා බිෆෝ මැරේජ්

මට මේ දැන් මතක් වුනේ මගේ අම්මගේ දෙවැනි නම සුජාත , එයා බඳින්න කලින් පෙරේරා

My face lit up. “Yes, I knew you are Sujatha’s daughter. You look very much like your mother.”

මයි ෆේස් ලිට් අප් . “ යස් , අයි නිව් යූ ආ සුජතාස් ඩෝට(ර්) . යූ ලුක් වෙරි මච් ලයික් යුව(ර්) මද(ර්)

මගේ මුහුණ එළිය වුනි . “ ඔව් . මම දන ගත්තා ඔයා සුජාතාගේ දුව කියලා . ඔයා ගොඩාක් ඔයාගේ අම්ම වගේ “

“Why are you looking for my mother?”

වයි ආ යූ ලුකිං ෆෝ මයි මද(ර්) ?

ඇයි ඔයා මගේ අම්මව හොයන්නේ ?

“To invite her to a get-together of past pupils of our village school.”

ටූ ඉන්වයිට් හ(ර්) ටු අ ගෙට් ටුගෙද(ර්) ඔෆ් පාස්ට් පියුපිල්ස් ඔෆ් අව(ර්) විලේජ් ස්කූල්

අපේ ගමේ ස්කොලේ ආදී ශිෂ්‍යයන්ගේ හමුවකට අරධනා කරන්න

“Wow, she will be very happy about it. She talks a lot about her younger days in the village.

වව්, ෂී විල් බී වෙරි හැපී අබවුට් ඉට් . ෂී ටෝක්ස් අ ලොට් අබවුට් හ(ර්) යංග(ර්) ඩේස් ඉන් ද විලේජ් .

ෂා ! එයා ගොඩක් සතුටු වේවි ඒ ගැන . එයා ගොඩාක් කියනවා ගමේ එයාගේ ළමා කාලය ගැන (younger days - බාල කාලය)

She sometimes tells me stories about the village and the school she studied at. I will call her right now. She is on the way back home.”

ෂී සම්ටයිම්ස් ටෙල්ස් මී ස්ටෝරීස් අබවුට් ද විලේජ් ඇන්ඩ් ද ස්කූල් ෂී ස්ටඩීඩ් ඇට් . අයි විල් කෝල් හ(ර්) රයිට් නව් . ෂී ඉස් ඔන් හ(ර්) වේ බැක් හෝම්

සමහර වෙලාවට එයා මට කියනව ගම ගැනයි එයා ඉගෙන ගත් ස්කොලේ ගැන කතන්දර .මම දැන්මම එයට කෝල් කරන්නම් . එයා ගෙදර එන ගමන්

“I couldn’t find her number. One of her friends at our hometown said she was living at this

address a few years back but she had also lost her telephone number,” I said.

අයි කුඩින්ට් ෆයින්ඩ් හ(ර්) නම්බ(ර්) . වන් ඔෆ් හ(ර්) ෆ්‍රෙන්ඩ්ස් ඇට් අව(ර්) හෝම් ටවුන් සේඩ් ෂී වෝස් ලිවිං ඇට් දිස් ඇඩ්‍රස් අ ෆිව් ඉය(ර්)ස් බැක් බට් ෂී හෑඩ් ඕල්සෝ ලොස්ට් හ(ර් ) ටෙලිෆෝන් නම්බ(ර්) “ අයි සේඩ්

මට එයාගේ නොම්මරේ හොයා ගන්න බැරි වුනා . අපේ ගම් පළාතේ එයාගේ යාලුවෙක් මට කිව්වා එයා මේ ලිපිනයේ හිටිය කියලා අවුරුදු කීපෙකට කලින් නමුත් එයාටත් එයාගේ ටෙලිෆෝන් නොම්මරේ නැති වෙලා තිබුනේ . මම කීවෙමි

“OK, no problem. Now you have found her,” she said with her lovely smile.

“ඕකේ , නෝ ප්‍රොබ්ලම් , නව් යූ හෑව් ෆවුන්ඩ් හ(ර්)” ෂී සේඩ් විත් හ(ර්) ලව්ලි ස්මයිල්

හරි , ප්‍රශ්නයක් නැහැ , දැන් ඔයාට එයාව හම්බ වුනානේ . ඇය ඇගේ පියකරු සිනහව සමග කීවාය

Out of our friends, there were a few others that we couldn’t contact at all. It was like they had disappeared into another world .

අවුට් ඔෆ් අව(ර්) ෆ්‍රෙන්ඩ්ස්, දෙයා(ර්) ව(ර්) අ ෆිව් අද(ර්)ස් දැට් වී කුඩින්ට් කන්ටැක්ට් ඇට් ඕල්. ඉට් වෝස් ලයික් දේ හෑඩ් ඩිසැපිය(ර්)ඩ් ඉන්ටු අනද(ර්) ව(ර්)ල්ඩ් .

අපගේ යහළුවන්ගෙන් අපට කිසිසේත් සම්බන්ධ කරගත නොහැකි වූ කිහිප දෙනෙක් විය. ඔවුන් වෙනත් ලොවකට අන්තර්ධාන වුවා වැනි විය (disappear - ඩිස පිය(ර්) - අතුරුදන් වෙනවා )

Nobody had heard anything from them ever since they left school. We did not try to find them either, but deep down in my mind, I wanted to see Sujatha once again.

නෝ බොඩි හෑඩ් හ(ර්)ඩ් එනිතින් ෆ්‍රොම් දෙම් එව(ර්) සින්ස් දේ ලෙෆ්ට් ස්කූල් . වී ඩිඩ් නොට් ට්‍රයි ටු ෆයින්ඩ් දෙම් අයිද(ර්), බට් ඩීප් ඩවුන් ඉන් මයි මයින්ඩ් , අයි වෝන්ටඩ් ටු සී සුජාතා වන්ස් අගේන්

ඔවුන් පාසල හැරගිය දා සිටම කිසිවෙකු ඔවුන් පිලිබඳ කිසිවක්ම අසා තිබුනේ නැත .අපි ඔවුන් සෙවීමටත් උත්සාහ නොකළෙමු .නමුත් මගේ හිත පතුලෙන්ම මට සුජාතාව නැවත දැක ගැනීමට වුවමනා විය .

The girl was ringing up her mother. Once her mother was on the phone, she excitedly broke the news that one of her old friends from her village school had come to visit her.

ද ග(ර්)ල් වෝස් රිංගිං අප් හ(ර්) මද(ර්) . වන්ස් හ(ර්) මද(ර්) වෝස් ඔන් ද ෆෝන් , ෂී එක්සයිටඩ්ලි බ්‍රෝක් ද නිව්ස් දැට් වන් ඔෆ් හ(ර්) ඕල්ඩ් ෆ්‍රෙන්ඩ්ස් ෆ්‍රොම් හ(ර්) විලේජ් ස්කූල් හෑඩ් කම් ටු විසිට් හ(ර්)

යුවතිය ඇගේ මවට ඇමතුවාය .ඇගේ මව දුරකතනයට සම්බන්ධ වූ වහාම , ඇගේ ගමේ පාසලේ ඇගේ පැරණි මිතුරෙක් ඇය බැලීමට පැමිණ තිබෙන පුවත මහත් උද්යෝගයෙන් සැල කලාය .

“What's your name, Uncle?” she asked me while holding the phone. After a few seconds, she hung up and looked at me with her lovely smile.

වට්ස් යුව(ර්) නේම්, අංකල් ? ෂී ආස්ක්ඩ් මී වයිල් හෝල්ඩින් ද ෆෝන් . ආෆ්ට(ර්) අ ෆිව් සෙකන්ඩ්ස් , ෂී හං අප් ඇන්ඩ් ලුක්ඩ් ඇට් මී විත් හ(ර්) ලව්ලි ස්මයිල්

ඔයාගේ නම මොකක්ද , අංකල් ? දුරකථනය රදවා ගෙනම ඇය මගෙන් ඇසුවාය. තත්පර කීපයකට පසු ඇය දුරකතය තබා ඇගේ පියකරු සිනහව සමගින් මා දෙස බැලුවාය

“Uncle, she asked you to stay until she comes. She will be here in another 20 minutes. Until then, she asked me to make some tea for you,” she said in her adorable way.

අංකල් , ෂී ආස්ක්ඩ් යූ ටු ස්ටේ අන්ටිල් ෂී කම්ස් . ෂී විල් බී හිය(ර්) ඉන් අනද(ර්) ට්වෙන්ටි මිනිට්ස් . අන්ටිල් දෙන් , ෂී ආස්ක්ඩ් මී ටු මේක් සම් ටී ෆෝ යූ . ෂී සේඩ් ඉන් හ(ර්) ඇඩෝරබල් වේ

අංකල් , එයා ඔයාට කිව්වා එයා එනකල් ඉන්න කියලා. තව මිනිත්තු 20 කින් එයා මෙහෙ .එතකල් එයා මට කිව්වා ඔයාට තේ ටිකක් හදන්න කියලා. ඇය ඇගේ සුරතල් ස්වරූපයෙන් කීවාය (adorable - ඇඩෝරබල් - ආදරේ හිතෙන )

**Language Focus**

- මුලින්ම මේ වාක්‍යය ගනිමු

Even before she answered, I knew she was Sujatha's daughter
ඊවන් බිෆෝ ෂී ආන්ස(ර්)ඩ් අයි නිව් ෂී වෝස් සුජාතාස් ඩෝට(ර්)
ඇය උත්තර දෙන්නත් ප්‍රථම, ඇය සුජාතාගේ දියණිය බව මම දැන ගතිමි

- Before she answered - ඇය උත්තර දෙන්න කලින් . මේ වාක්‍යය අපට පැහැදිලියි. අපි ඒක දැනටමත් දන්නවා. අපි සම්බන්ධක පද පාඩමේදී before සම්බන්ධක පදයක් ලෙස යෙදෙන හැටි ඉගෙන ගත්තා. මෙතැනදී before වලට even එකතු වුනාම before වලින් එන අර්ථය තව උද්දීපනය වෙනවා - ඇය උත්තර දෙන්නත් කලින්ම වගේ අර්ථයක් එවිට එන්නේ

  බලමු ඒ වගේ තවත් උදාහරණ කීපයක්

Even before I woke up, he was here at my doorstep
ඊවන් බිෆෝ අයි වෝක් අප්, හී වෝස් හියර්(ර්) ඇට් මයි ඩෝස්ටෙප්
මම නැගිටින්නත් කලින්ම ඔහු මෙහෙ මගේ දොරකඩ (doorstep- දොරකඩ)

She left the house even before I could talk to her
ශී ලෙෆ්ට් ද හවුස් ඊවන් බිෆෝ අයි කුඩ් ටෝක් ටු හ(ර්)
මම ඇයට කතා කරන්නත් කලින්ම ඇය නිවසෙන් පිටව ගියා

Even before we arrived, they had started eating.
ඊවන් බිෆෝ වී අරයිව්ඩ් , දේ හෑඩ් ස්ටාටඩ් ඊටිං
අපි එන්නත් කලින්ම ඔවුන් කන්න පටන් අරන් තිබුනා

I understood the truth even before he opened up his mouth.
අයි අන්ඩස්ටුඩ් ද ටෲත් ඊවන් බිෆෝ හී ඔපන්ඩ් අප් හිස් මවුත්
ඔහු කට අරින්නත් පෙරම, මම සත්‍යය තේරුම් ගත්තා

They had stopped work even before it had started raining.
දේ හෑඩ් ස්ටොප්ඩ් ව(ර්)ක් ඊවන් බිෆෝ ඉට් හෑඩ් ස්ටාටඩ් රේනිං
වැසි පටන් ගන්නත් කලින්ම ඔවුන් වැඩ නතර කර තිබුණා

Even before she answered, I knew she was going to lie about this
ඊවන් බිෆෝ ෂී ආන්ස(ර්)ඩ් , අයි නිව් ෂී වෝස් ගොයිං ටු ලයි අබවුට් දිස්
ඇය පිළිතුර දීමටත් පෙරම, මම දැනගත්තා ඇය මේ ගැන බොරු කියන්න යන බව

They closed the bag even before I saw it.

දේ ක්ලෝස්ඩ් ද බෑග් ඊවන් බිෆෝ අයි සෝ ඉට්
මම දකින්නත් කලින්ම ඔවුන් බෑග් එක වැහුවා

She had to cook for them even before she could take a breath after a long journey.
ශී හෑඩ් ටු කුක් ෆෝ දෙම් ඊවන් බිෆෝ ෂී කුඩ් ටේක් අ බ්‍රෙත් ආෆ්ට(ර්) අ ලෝං ජ(ර්)නි
දිගු ගමනකින් පසු, ඇය හුස්මක් ගන්නත් කලින්ම ඔවුන්ට කෑම උයන්න ඇයට සිදුවුණා (take a breath -හුස්මක් ගන්නවා / වෙහෙස නිවා ගන්නවා )

I am sure he will upset our plans even before we start on them.
අයෑම් ෂුව(ර්) හී විල් අප්සෙට් අව(ර්) ප්ලෑන්ස් ඊවන් බිෆෝ වී ස්ටාට් ඔන් දෙම්
අපි පටන් ගන්නත් කලින්ම ඔහු අපේ සැලසුම් අවුල් කරනවා කියල මට විශ්වාසයි

- මීළඟට මේ වාක්‍යය

She almost suspected me of being a thief
ෂී ඕල්මෝස්ට් සස්පෙක්ටඩ් මී ඔෆ් බීන් අ තීෆ්
ඇය මා සොරෙකැයි තව පොඩ්ඩෙන් සැක සිතුවාය

- Almost කියන පදයෙන් කරන්නේ ඒ සමග යෙදෙන අනිත් පදයෙන් කියවෙන අර්ථයට ( එය ක්‍රියාවක් හෝ යම් තත්වයක් විය හැකියි), ඉතාම ආසන්න වුනා කියන අදහස දෙන එක. ඒ සමඟ යෙදෙන්නේ ක්‍රියාවක් නම් ඒ ක්‍රියාව කරන්න හෝ සිදුවෙන්න ඉතාම ආසන්න තැනකට ආවා කියල ඉන් අදහස් වෙනවා . ඉහත වාක්‍යයේ තිබෙන්නේ එවැනි අර්ථයක් . අපි තවත් උදාහරණ ගනිමු

He almost missed the train.
හී ඕල්මෝස්ට් මිස්ඩ් ද ට්‍රේන්
ඔහුට තව පොඩ්ඩෙන් කෝච්චිය මඟ හැරුනා

They almost forgot their bags.
දේ ඕල්මෝස්ට් ෆොගොට් දෙයා බෑග්ස්
ඔවුන්ට තව පොඩ්ඩෙන් ඔවුන්ගේ බෑග් අමතක වුණා

She almost fell while climbing the stairs.
ෂී ඕල්මෝස්ට් ෆෙල් වයිල් ක්ලයිම්ං ද ස්ටෙයාස්
පඩිපෙළ නගිද්දී ඇය තව පොඩ්ඩෙන් වැටුනා

He almost revealed the secret.

හී ඕල්මෝස්ට් රිවීල්ඩ් ද සීක්‍රට්
ඔහු තව පොඩ්ඩෙන් රහස එලි කළා

They were almost run over by a vehicle.

දේ ව(ර්) ඕල්මෝස්ට් රන් ඕව(ර්) බයි අ වෙහිකල්

තව පොඩ්ඩෙන් ඔවුන්ව වාහනයකට අහුවුනා (වාහනයක් යට කරන් යනවට කියන්නේ run over කියලා. මෙය කර්ම කාරක වාක්‍යයක් . run වල past participial එකත් run මයි )

I almost lost my purse
අයි ඕල්මෝස්ට් ලොස්ට් මයි ප(ර්)ස්

තව පොඩ්ඩෙන් මගේ ප(ර්)ස් එක නැති වෙනවා

She almost forgot to lock the door.
ෂී ඕල්මෝස්ට් ෆොගොට් ටු ලොක් ද ඩෝ
ඇයට තව පොඩ්ඩෙන් දොර ලොක් කරන්න අමතක වුනා

He almost missed the meeting.
හී ඕල්මෝස්ට් මිස්ඩ් ද මීටිං
ඔහුට තව පොඩ්ඩෙන් රැස්වීම මඟ හැරෙනවා

I almost cried when I heard the news.
අයි ඕල්මෝස්ට් ක්‍රයිඩ් වෙන් අයි හ(ර්)ඩ් ද නිව්ස්
ආරංචිය ඇහුවම මට ඇත්තටම ඇඩුනා වගේ වුනා

මතක තියාගන්න ඒ එකම ක්‍රියාවක් වත් සිදුවුනේ නැහැ , සිදුවෙන්න ඉතාම ආසන්න වුනා පමණයි

- ඊළගට කාව හරි මොකකට හරි සැක කරනවා කියන කොට of කියන නිපාත පදය එක්ක තමයි වාක්‍ය සැකසුම එන්නේ . අපි තවත් උදාහරණ බලමු

She suspected him of lying
ෂී සස්පෙක්ටඩ් හිම් ඔෆ් ලයියිං
ඇය ඔහු බොරු කියන බව සැක කළා

They suspected him of cheating in the exam.

දේ සස්පෙක්ටඩ් හිම් ඔෆ් චීටිං ඉන් දි එග්සෑම්
විභාගයේදී වංචා කල බවට ඔවුන් ඔහුව සැක කළා

I suspect her of hiding the truth
අයි සස්පෙක්ට් හ(ර්) ඔෆ් හයිඩිං ද ට්‍රෲත්
ඇත්ත හංගනවා කියලා මම ඇයව සැක කරනවා

She suspects them of stealing her plants
ෂී සස්පෙක්ට්ස් දෙම් ඔෆ් ස්ටීලිං හ(ර්) ප්ලාන්ට්ස්
ඇගේ පැල හොරකම් කළා කියලා ඇය ඔවුන්ව සැක කරනවා

He was suspected of stealing the money.
හී වෝස් සස්පෙක්ටඩ් ඔෆ් ස්ටීලිං ද මනි
මුදල් සොරකම් කළා කියලා ඔහුව සැක කෙරුනා ( මෙය passive voice වාක්‍යයක් )

- ඊළඟට මේ වාක්‍යය

No, that's not the one I am looking for."
නෝ ,දැට්ස් නොට් ද වන් අයි වෝස් ලුකිං ෆෝ
නෑ , ඒ මං හොයන කෙනා නෙවෙයි

- මෙතන සම්බන්ධක සර්ව නාමයක් තියෙනවා . එය සැඟවී තිබෙන්නේ . අපිට අවශ්‍ය නම් ඒ ආකාරයට that අතහැර වාක්‍යය කිව හැකියි . බොහෝවිට කතාවේදී භාවිත වෙන්නේ එහෙම

That's not the one ( that ) I am looking for

ඒ රටාවේම තවත් වාක්‍යය කීපයක් බලමු

This is not the book (that ) I wanted.
දිස් ඉස් නොට් ද බුක් අයි වෝන්ටඩ්
මෙය නෙවෙයි මට ඕන පොත

That's not the place (that) we visited last time.
දැට්ස් නොට් ද ප්ලේස් වී විසිටඩ් ලාස්ට් ටයිම්
අපි ගිය වතාවේ ගිය ස්ථානය එය නොවේ

This is not the dress(that ) she wore that day
දිස් ඉස් නොට් ද ඩ්‍රෙස් ෂී වෝ දැට් ඩේ
ඇය එදා ඇඳපු ඇඳුම මේක නොවෙයි

That’s not the answer (that ) I expected.
දැට්ස් නොට් ද ආන්ස(ර්) අයි එක්ස්පෙක්ටඩ්
මම බලාපොරොත්තු වුනු පිළිතුර ඒක නෙවෙයි

This is not the way (that) you should handle this
දිස් ඉස් නොට් ද වේ යූ ෂුඩ් හැඩ්ල් දිස්
ඔබ මෙය හැසිරවිය යුතු ක්‍රමය මෙය නොවෙයි

That’s not the song (that ) I wanted to hear.
දැට්ස් නොට් ද සෝං අයි වෝන්ටඩ් ටු හියර(ර්)
මට අහන්න ඕනවුණු සින්දුව ඒක නෙවෙයි

- ඊළඟට මේ වාක්‍යය

It just came to my mind that my mom’s second name is Sujatha
ඉට් ජස්ට් කේම් ටු මයි මයින්ඩ් දැට් මයි මම්’ස් සෙකන්ඩ් නේම් ඉස් සුජාතා
මට මේ දැන් මතක් වුනේ මගේ අම්මගේ දෙවැනි නම සුජාත

- Come to (one ‘s )mind - කියන්නේ හොඳ යෙදුමක් . මතක් වෙනවා , සිහියට එනවා කියන එක එහි තේරුම

It came to my mind that the area is covered by mist after 5 pm.
ඉට් කේම් ටු මයි මයින්ඩ් දැට් දි ඒරියා ඉස් කව(ර්)ඩ් බයි මිස්ට් ආෆ්ට(ර්) ෆයිව් පී.එම්.
පස්වරු 5ට පසු එම ප්‍රදේශය මීදුමෙන් වැසෙන බව මට මතක් වුනා

It came to my mind that I had left the door unlocked.
ඉට් කේම් ටු මයි මයින්ඩ් දැට් අයි හෑඩ් ලෙෆ්ට් ද ඩෝ අන්ලොක්ඩ්
දොර ලොක් කරන්නේ නැතුව ආවේ කියලා මට මතක් වුනා

It came to my mind that she was on leave that day
ඉට් කේම් ටු මයි මයින්ඩ් දැට් ෂී වෝස් ඔන් ලීව් දැට් ඩේ
ඇය එදා නිවාඩු බව මට මතක් වුනා

Suddenly, it came to my mind that I had forgotten her birthday.
සඩ්න්ලි, ඉට් කේම් ටු මයි මයින්ඩ් දැට් අයි හෑඩ් ෆොගොට්න් හිස් බ(ර්)ත්ඩේ
හදිසියේම මට මතක් වුණේ මට ඇයගේ උපන්දිනය අමතක වුනා කියලා

It came to my mind that I should call her immediately.
ඉට් කේම් ටු මයි මයින්ඩ් දැට් අයි ෂුඩ් කෝල් හ(ර්) ඉමීඩියේට්ලි
මම වහාම ඇයට ඇමතුමක් ගත යුතු බව මට මතක් වුනා

It came to my mind that I had left my bag at home.
ඉට් කේම් ටු මයි මයින්ඩ් දැට් අයි හෑඩ් ලෙෆ්ට් මයි බෑග් ඇට් හෝම්
බෑග් එක ගෙදර දාල ඇවිත් කියලා මට මතක් වුනා

- ඊළගට මේ වාක්‍යය

You look very much like your mother."
යූ ලුක් වෙරි මච් ලයික් යුව(ර්) මද(ර්)
ඔයා ගොඩාක් ඔයාගේ අම්ම වගේ "

- කව්රු හරි පෙනුමින් තව කව්රු හරි වගේ කියල කියන තවත් විධි කීපයක් අපි බලමු. මොකද ඒ වගේ වාක්‍යය අපිට නිතර සාමාන්‍ය කතාවේදී කියවෙන නිසා

You really look like your mother

යූ රියලි ලුක් ලයික් යුව(ර්) මද(ර්)
ඔයා ඇත්තටම ඔයාගේ අම්මා වගේ

You look a lot like your mother
යූ ලුක් අ ලොට් ලයික් යුව(ර්) මද(ර්)
ඔයා ගොඩාක් ඔයාගේ අම්මා වගේ

You're just like your mother
යූ ආ ජස්ට් ලයික් යුව(ර්) මද(ර්)
ඔයා අම්මා වගේමයි

He takes after his father a lot.
හී ටේක්ස් ආෆ්ට(ර්) හිස් ෆාද(ර්) අ ලොට්.
ඔහු තම තාත්තා වගේ ගොඩක් ( take after කියන්නේ (යම් පුද්ගලයෙක් )පෙනුමින් සමානයි කියන අර්ථය දෙන යුගල ක්‍රියා පදයක් )

- ඊළඟට මේ වාක්‍යය

Nobody had heard anything from them ever since they left school
නෝ බොඩි හෑඩ් හ(ඊ)ඩ් එනිතිං ෆ්‍රොම් දෙම් එව(ර්) සින්ස් දේ ලෙෆ්ට් ස්කූල්
ඔවුන් පාසල හැරගිය දා සිටම කිසිවෙකු ඔවුන් පිලිබඳ කිසිවක්ම අසා තිබුනේ නැත

- මෙතන ever since කියන තැනට අපි අපේ අවධානය යොමු කරමු.
  Since කියන්නේ "සිට " , " අතීතයේ යම් කිසි අවස්තාවක සිට"

I have been working here since 2000

අයි හෑව් බීන් ව(ර්)කින් හියා(ර්) සින්ස් ටූ තවුසන්ඩ්

මම 2000 ඉදලා මෙහෙ වැඩ කරනවා

- Ever since කියන්නේ "එතැන් සිටම " කියන එක .

තවත් උදාහරණ වාක්‍යය බලමු

I have never seen her again ever since she let her job
අයි හැව් නෙව(ර්) සීන් හ(ර්) අගේන් එව(ර්) සින්ස් ෂී ලෙට් හ(ර්) ජොබ්
ඇය රැකියාව හැර ගිය දවසේ සිටම මම ඇයව ආපහු දැකලා නැහැ

He has changed a lot ever since he moved to Colombo,
හී හෑස් චේන්ජ්ඩ් අ ලොට් එව(ර්) සින්ස් හී මූව්ඩ් ටු කොළම්බෝ
ඔහු කොළඹට ගිය දා ඉදලම ඔහු බොහෝ ලෙස වෙනස් වෙලා

She has been very quiet ever since she lost her job
එව(ර්) සින්ස් ෂී ලොස්ට් හ(ර්) ජොබ් , ෂී හැස් බීන් වෙරි ක්වයට්
ඇය රැකියාව අහිමි වූ දා සිට, ඇය ඉතා නිහඬයි

We have stayed in touch ever since we met last year
වී හෑව් ස්ටේඩ් ඉන් ටච් එව(ර්) සින්ස් වී මෙට් ලාස්ට් ඉය(ර්)
අපි පසුගිය අවුරුද්දේ අපි හමුවූ දා සිටම , අපි සම්බන්ධතාවය පවත්වාගෙන තියෙනවා

He has been afraid to drive ever since the accident he met with last year
හී හෑස් බීන් අෆ්‍රේඩ් ටු ඩ්‍රයිව් එව(ර්) සින්ස් ද ඇක්සිඩන්ට් හී මෙට් විත් ලාස්ට් ඉය(ර්)
ගිය අවුරුද්දෙ ඔහු මුහුණ දුන් අනතුරේ සිටම ඔහු රිය පැදවීමට බියව ඉන්නවා (meet with an

accident - අනතුරකට මුහුන දෙනවා )

She hasn’t spoken to anyone ever since she heard the news
ෂී හැස්න්ට් ස්පෝකන් ටු එනිවන් එව(ර්) සින්ස් ෂී හ(ර්)ඩ් ද නිව්ස්
ඇය එම පුවත ඇසූ දා සිටම , ඇය කිසිවෙකු සමඟ කතා කරලා නැහැ

- අවසන් වශයෙන් මේ වාක්‍යය . එහි Out of our friends at school කියන කොටස

Out of our friends at school , there were a few others that we couldn’t contact at all.
අවුට් ඔෆ් අව(ර්) ෆ්‍රෙන්ඩ්ස් ඇට් ස්කූල් , දෙයා(ර්) ව(ර්) අ ෆිව් අද(ර්)ස් දැට් වී කුඩ්න්ට් කොන්ටැක්ට් ඇට් ඕල් (ඇටෝල් )
පාසලේ අපගේ යහළුවන්ගෙන් අපට කිසිසේත් සම්බන්ධ කරගත නොහැකි වූ කිහිප දෙනෙක් විය.

- යම් විශාල ප්‍රමාණයකින් කුඩා ප්‍රමාණයක් දක්වද්දී මේ විදියට out of …කියන වාක්‍යය ඛණ්ඩය පාවිච්චි කරනවා

Out of all my family members, I love my younger sister the most.
අවුට් ඔෆ් ඕල් මයි ෆැමිලි මෙම්බ(ර්)ස් , අයි ලව් මයි යංග(ර්) සිස්ට(ර්) ද මෝස්ට්
මගේ සියලුම පවුල් සාමාජිකයන් අතරින්, මම වැඩිපුරම ආදරය කරන්නේ මගේ බාල සහෝදරියටයි

Nine out of ten students are using social media in their free time
නයින් අවුට් ඔෆ් ටෙන් ස්ටුඩන්ට්ස් ආ යූසිං සෝෂල් මීඩියා ඉන් දෙයා ෆ්‍රී ටයිම්
සිසුන් දහයෙන් නව දෙනෙක් ඔවුන්ගේ නිදහස් වේලාවන් වල සමාජ මාධ්‍ය භාවිතා කරනවා

Out of all the books, this is my favorite.
අවුට් ඔෆ් ඕල් ද බුක්ස් , දිස් ඉස් මයි ෆේවරිට්
සියලුම පොත් අතරින්, මෙය මගේ ප්‍රියතම පොතයි

Out of all the places I have visited , I like this one best.
අවුට් ඔෆ් ඕල් ද ප්ලේසස් , අයි ලයික් දිස් වන් බෙස්ට්
මම ගිහින් තියෙන සියලුම ස්ථාන අතරින්, මට වැඩිපුරම කැමති මෙතනට

Out of my friends, he understands me the most.
අවුට් ඔෆ් මයි ෆ්‍රෙන්ඩ්ස් , හී අන්ඩස්ටෑන්ඩ්ස් මී ද මෝස්ට්
මගේ මිතුරන් අතරින්, මාව වැඩිපුරම තේරුම් ගන්නේ ඔහුයි

Out of all the answers, this one is correct.
අවුට් ඔෆ් ඕල් දි ආන්ස(ර්)ස් , දිස් වන් ඉස් කරෙක්ට්
සියලුම පිළිතුරු අතරින්, නිවැරදි එක මේක

Out of ten houses, only two were damaged in the storm
අවුට් ඔෆ් ටෙන් හවුසස් , ඔන්ලි ටූ ව(ර්) ඩැමේජ්ඩ් ඉන් ද ස්ටෝම්

ගෙවල් දහයකින් , දෙකක් පමණයි කුනාටුවේදී හානි වුනේ

How do you rate this app out of ten?
හවු ඩූ යූ රේට් දිස් ඇප් අවුට් ඔෆ් ටෙන් ?
ඔයා මේ ඇප් එකට දහයෙන් කීයක් ලකුණු දෙනවාද?

**Vocabulary 60**

Appearance – අපියරන්ස් – පෙනුම

Resemble – රිසෙම්බල් – සමාන වෙනවා

Politely – පොලයිට්ලි – විනීතව, ආචාරශීලීව

Lovely – ලව්ලි – ලස්සන, ආකර්ෂණීය

Disappointed – ඩිසපොයින්ටඩ් – බලාපොරොත්තු කඩ වූ

Directions – ඩිරෙක්ෂන්ස් – මාර්ග උපදෙස්

Grumpy – ග්‍රම්පි – කෝපයෙන් යුත් , මුඩුම

Suspect – සස්පෙක්ට් – සැක කරනවා

Fill – ෆිල් – පුරවනවා

Sadness – සෑඩ්නස් – දුක

Hurry – හරී – ඉක්මන් කරනවා , ඉක්මන් යනවා

Light up – ලයිට් අප් – එලිය කරනවා (අතීත - lit up )

Get-together – ගෙට් ටුගෙද(ර්) – සුහද හමුව

Pupil – පියුපිල් – ශිෂ්‍යයා

Disappear – ඩිසපිය(ර්) – අතුරුදහන් වෙනවා

Disappeared – ඩිසපිය(ර්)ඩ් – අතුරුදහන් වුණු

Ring up – රිං අප් – දුරකථන ඇමතුමක් ගන්නවා (අතීත rang up )

Excitedly – එක්සයිටඩ්ලි – උද්යෝගයෙන්

Break a news – බ්‍රේක් අ නිව්ස් – පුවතක් දැනුම් දෙනවා (අතීත - broke a news )

Hang up – හැං අප් – දුරකථනය තබනවා ,ඇමතුම කට් කරනවා (අතීත hung up )

Hurtful – හ(ර්)ට්ෆුල් – සිත් රිදවන, වේදනාකාරී

Idle – අයිඩ්ල් – අලස , කම්මැලි , වැඩක් නොකරන

Idler – අයිඩ්ල(ර්) – කම්මැලි පුද්ගලයා, වැඩක් නොකරන කෙනා

Humorous – හියුමරස් – හාස්‍යජනක

Illusion – ඉලූෂන් – මායාව, භ්‍රමය

Mirage – මිරාජ් – මිරිඟුව

Inherit – ඉන්හෙරිට් – උරුම කරගන්නවා, උරුම වෙනවා

Influence – ඉන්ෆ්ලුවන්ස් – බලපෑම , බලපානවා

Landscape – ලෑන්ඩ්ස්කේප් – භූ දර්ශනය

Landslide – ලෑන්ඩ්ස්ලයිඩ් – නායයෑම

Landlord – ලෑන්ඩ්ලෝඩ් – ඉඩම් හිමියා, ගෙහිමියා

Passion – පැෂන් – දැඩි ආශාව, උද්යෝගය

Fashion – ෆැෂන් – විලාසිතාව

Perfume – ප(ර්)ෆියුම් – සුවඳ විලවුන්, සුවඳ ද්‍රව්‍ය

Rural – රූරල් – ග්‍රාමීය, ගම්බද

Schoolmate – ස්කූල්මේට් – පාසල් මිතුරා , පාසල් මිතුරිය

Medal – මෙඩල් – පදක්කම

Goodwill – ගුඩ්විල් – හොඳ හිත

Gorgeous – ගෝජස් – ඉතා ලස්සන, අලංකාර

Gossip – ගොසිප් – කතා බහ, කටකතා

Rumour – රියුම(ර්) – කට කතාව

Grab – ග්‍රැබ් – අල්ලා ගන්නවා

Gradually – ග්‍රැජුවලි – ක්‍රමයෙන්

Graduate – ග්‍රැජුවේට් – උපාධිධාරියා;

Graduation – ග්‍රැජුවේෂන් – උපාධි ප්‍රදාන උත්සවය

Grape – ග්‍රේප් – මිදි

Grapevine – ග්‍රේප්වයින් – මිදිවැල